කාඩ් /1/126-1

මගේ අංකය :- පොදිලේ/අ/~~17/2/1/2~~,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
පොළොන්නරුව,
2017.04.05.

MO-11
21 APR 2017
වාරිමාර්ග කළමනාකරණ අංශය.

වගා රැස්වීම් තීරණ 2017 යල කන්නය .
පරාක්‍රම සමුද්‍රය මහා වාරි මාර්ග ව්‍යාපාරය.

1994 අංක 13 දරණ වාරිමාර්ග පනතේ සංශෝධිත 1968 අංක 48 දරණ වාරිමාර්ග ආඥා පනතේ විධිවිධාන අනුව 2017.04.05 වන දින පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේ දී පැවති වගා රැස්වීමේදී පරාක්‍රම සමුද්‍රය මහා වාරිමාර්ග බල ප්‍රදේශයේ 2017 යල කන්නය සඳහා එළඹෙන ලද තීරණ.

- වගා කිරීමට අපේක්ෂිත භෝග වර්ග - මාස 3 , 3 ½ වී සහ වෙනත් ක්ෂේත්‍ර භෝග
- වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය - හෙක්. 10365 (නීත්‍යානුකූල බිම් ප්‍රමාණය )
- මුල්වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - 2017.04.17
- මුර ජලය ආරම්භ කරන දිනය - 2017.05.01
- අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - 2017.08.05
- වගාව පිහිටුවා අවසන් කල යුතු දිනය - 2017.05.01
- ගොවීන් විසින් ඇලවේලි සුද්ධ කර අවසන් කල යුතු දිනය - 2017.04.15
  ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ නොකරනු ලබන ඇලවල් ගොවි සංවිධානය විසින් ශුද්ධ කල යුතු දිනය - 2017.04.16
- වගා රක්ෂණය අවසන් කල යුතු දිනය - 2017.05.01
- වගාභානි දැක්වීම් දිය යුතු දිනය - 2017.08.05
- අස්වනු නෙලා අවසන් කල යුතු දිනය - 2017.08.30
- ගොඩ ඉඩම් රක්ෂිත වගා කිරීම තහනම්. නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කෙරේ.

1994 අංක 13 ( සංශෝධිත ) දරණ වාරිමාර්ග ආඥා පනත 11 වගන්තියෙහි 1 හා 2 උප වගන්ති අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නීති රීති .

I. කෙත් ඇලවල් සහ බෙදුම් ඇලවල් වල නඩත්තුව සඳහා අක්කර 01 කට රු 100.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුයි .
II. නියමිත දිනට බෙදුම් ඇලවල් සහ කෙත් ඇලවල් වල කම කොටස නඩත්තු නොකරන ගොවීන්ගෙන් බණියකට රු 500 .00 ක මුදලක් අය කිරීම
III. පිදුරු පිළිස්සීම වෙනුවෙන් අක්කර 1 කට රු 10000.00 ක මුදලක් අය කරනු ඇත.
IV. ජලය නිකුත් කිරීම අවසන් කිරීමට යෝජිත දිනයෙන් පසු ජලය ඉල්ලීම වෙනුවෙන් හෙක්ටයාර් 01 කට රු 250 /= ක මුදලක් අය කිරීම .
V. වාරිමාර්ග නිර්මිත වලට හානි කිරීම සම්බන්ධයෙන් වාරිමාර්ග ආඥාපනතේ පනවා ඇති නීති අනුව කටයුතු කිරීම .

රංජිත් ආරියරත්න,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
පොළොන්නරුව